# ජාතික රාජ්‍ය සභාවේ

# 1973 අංක 23 දරන බඩු උගස්ගන්නන්ගේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 ජූනි මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 ජූලි මස 20 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබා ගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 23 දරන බඩු උගස්ගන්නන්ගේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 ජූනි මස 30 වන දින]

එල්.ඩී.—ඕ. 33/72.

## බඩු උගස්ගන්නන්ගේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 23 දරන බඩු උගස්ගන්නන්ගේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

90 වන අධිකාරයේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන බඩු උගස්ගන්නන්ගේ ආඥාපනතේ 3 වන වගන්තියෙහි (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(2) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම දෙවන උපලේඛනයේ දක්වා ඇති "අ" ආකෘතියෙහි විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එම වගන්තිය ඒ ප්‍රඥප්තියේ 3අ වන වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය.

"දිසාපතිගේ පූර්ව අනුමතය නොමැතිව ව්‍යාපාර පවරාදීම බලරහිත විය යුතු බව.

3අ. 3 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් යම් ව්‍යාපාරයකට අදාළ වේ ද ඒ ව්‍යාපාරය දිසාපතිගේ පූර්ව ලිඛිත අනුමතය නොලබා එම බලපත්‍රය දරන්නා විසින් වෙන යම් තැනැත්තකුට පවරා නොදිය යුතු ය. තව ද එවැනි ව්‍යාපාරයක් එසේ පූර්ව අනුමතය නොලබා පවරා දීම, සියලු කාර්යයන් සඳහා ශුන්‍ය හා බල රහිත විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

"බලපත්‍රයේ පිටපත් පොලිස් අධිකාරීන් වෙත යැවිය යුතු බව.

4. දිසාපති විසින්, 3 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන එක් එක් බලපත්‍රයේ පිට පතක්, ඒ බලපත්‍රය අදාළ ව්‍යාපාරය පවත්වාගෙන යන දිස්ත්‍රික්කයේ පොලිස් අධිකාරී වෙත යැවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) එම වගන්තිය, එම වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන් ; සහ

(ආ) එම වගන්තියේ, එසේ නැවත අංක කරනු ලැබූ (1) වන උප වගන්තියට ඉක්බිතිව ම මෙහි පහත සඳහන් අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2) බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක් ම රුපියල් එකක් දඟසක බලපත්‍ර ගාස්තුවක් සමග ඉදිරිපත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙසින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) එම වගන්තිය, එම වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන් ; සහ

(ආ) එම වගන්තියේ එසේ නැවත අංක කරනු ලැබූ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2) 3 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බල පත්‍රයක් දරන යම් තැනැත්තකු එම බලපත්‍රය අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ අවස්ථාවක, ඒ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීමට පෙරාතුව යම් කාලසීමා වක් තුළ බලපත්‍රධාරියා විසින් බඩු උගස්ගන්නකු වශ යෙන් ස්වකීය ව්‍යාපාරය හා සම්බන්ධ ව, මේ ආඥාපනතේ විධිවිධානවල සාරාර්ථයට සහ අරමුණුවලට පටහැනි ක්‍රියා වන්හි යෙදී ඇති බව දිසාපතිගේ මතය වේ නම් ඒ බල පත්‍රය අලුත් කිරීම ඔහු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියෙහි (2) වන උපවගන් තිය ඉවත් කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අලුත් උපවගන් තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙසින් සංශෝධනය කරනු ලැබේ :—

"(2) තුන්වන උපලේඛනයේ දැක්වෙන විස්තර සෑම උගස් තුණ්ඩුවක ම මුල් පිටපතේ පසු පිටෙහි සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් කියවිය හැකි සේ මුද්‍රණය කර තිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය මෙසින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

"පොලී ප්‍රමාණය.

17. කිසිම බඩු උගස්ගන්නකු විසින් ඔබපත්‍ය යක් මත දෙනු ලබන ණයක් වෙනුවෙන් තුන්වන උපලේඛනයේ නිශ්චිත ව සඳහන් ප්‍රමාණය ඉක්ම වන පොලියක් අය නොකළ යුතු ය :

එසේ වුව ද ඔබපත්‍යක් මත දෙනු ලබන ණයක් වෙනුවෙන් ව්‍යාපාර පිරිවැටුම් බද්ද ගෙවිය යුතු අවස්ථාවක, බඩු උගස්ගන්නා විසින් එම බද්ද බඩු උගස් තබන්නාගෙන් අය කර ගැනීම, මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධානවල ඇතුළත් කිසිවකින් තහනම් කෙරෙන ලෙස නොසැලකිය යුතු ය.

මෙම වගන්තියේ "ඔබපනය" යන්නට, උගස් කරන ලද්දා වූ ද නියමිත දිනයට පෙර නිදහස් නොකරන ලද්දා වූ ද ඔබපනයක් ඇතුළත් වේ.'.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියෙහි (4) වන උප වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අලුත් උප වගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(4) (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවල විධි විධානවලට යටත්ව, ඔබපනය මත ගෙවිය යුතු ණය සහ ඊට අයවිය යුතු පොලිය ද ඒ ණය වෙනුවෙන් ගෙවිය යුතු ව්‍යාපාර පිරිවැටුම් බද්දක් වේ නම් එම බද්ද ද ගෙවූ විට බඩු උගස් ගන්නා විසින්, අවස්ථාවෝචිත පරිදි එකී ඔබපනය හා සම්බන්ධ උගස් තුණ්ඩුව ඉදිරිපත් කරන උගස් තබන්නා හෝ එම තුණ්ඩුව සතුව සිටින්නා හෝ වෙත එම ඔබපනය භාර දිය යුතු ය ; ඔබපනය එසේ භාර දීම සම්බන්ධයෙන් බඩු උගස්ගන්නාට මෙයින් ආරක්ෂාව සලසනු ලැබේ :

එසේ වුව ද උගස් තුණ්ඩුව දරන්නා, එය සොරකම් කර හෝ අන්‍යාකාරයකින් නීති විරෝධී ව එහි සන්තකය ලබාගෙන ඇති බව සැක කිරීමට බඩු උගස්ගන්නාට හේතු ඇත්නම්, බඩු උගස්ගන්නා විසින් ඒ තැනැත්තා සහ උගස් තුණ්ඩුව අල්ලා රඳවා ගෙන හැකිතාක් ඉක්මනින් පොලිස් නිලධරයකුට හෝ ග්‍රාම සේවකයකුට භාර දිය හැකි ය. නීතියට අනුකූල ව ක්‍රියා කිරීම සඳහා ඒ පොලිස් නිලධරයා හෝ ග්‍රාම සේවක විසින් ඒ තැනැත්තා සහ උගස් තුණ්ඩුව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් ඉදිරියට නොපමාව ගෙන යා යුතු ය.".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ගින්නක් ඇති වුවහොත් උගස්ගන්නාගේ බැඳීම.

24. (1) ගින්නෙන් හෝ ගින්නක් හේතුකොට ගෙන ඔබපනයක් විනාශ වූ හෝ ඔබපනයට හානි වූ අවස්ථාවක, උගස නිදහස් කළ හැකි කාලසීමාව ඇතුළත ඉල්ලා සිටිනු ලැබුවහොත්, එසේ විනාශවීම හෝ හානිවීම නොතකා, ණය මුදල සහ පොලිය ද, ඒ ණය වෙනුවෙන් ගෙවිය යුතු ව්‍යාපාර පිරිවැටුම් බද්දක් වේ නම් එම බද්ද ද අඩුකර ඔබපනයේ වටිනාකම ගෙවීමට බඩු උගස්ගන්නා බැඳී සිටිය යුතු ය

(2) සෑම බඩු උගස්ගන්නකු ම තමා වෙත උගස් කරනු ලැබ ඇති භාණ්ඩවල සම්පූර්ණ වටිනාකම ආවරණය වන පරිදි තම ව්‍යාපාරය රක්ෂණය කරවා ගත යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට, මෙහි පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

'බඩු උගස්ගන්නාගේ ලදුපත.

25. සෑම බඩු උගස්ගන්නකු ම ඔඩපනයක් නිදහස් කරන වේලාවේ දී, ඔහුට ආපසු ගෙවන ලද ණය මුදල සහ පොලී මුදල ද ඔහු විසින් යම් ව්‍යාපාර පිරිවැටුම් බද්දක් අය කර ගන්නා ලද නම් එම පිරිවැටුම් බද්ද ද සඳහා ලදුපතක් දී එම ලදුපතේ පිටපතක් ඔඩපත්‍ර පොතෙහි සුරක්ෂිතව තබා ගත යුතු ය. එම ලදුපත දෙවන උපලේඛන යේ දක්වා ඇති "උ" ආකෘතිය අනුව විය යුතු අතර, පොලිය සහ පිරිවැටුම් බද්දක් වේ නම් එම බද්ද රුපියල් විස්සක් හෝ ඊට වැඩි වන්නේ නම් මිස ලදුපත මුද්දර ගාස්තුවකට යටත් නොවිය යුතු ය.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම වගන්තිය එම වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ; සහ

(ආ) එම වගන්තියේ එසේ නැවත අංක කරනු ලැබූ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම මෙහි පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2) මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන යටතේ ඔඩපනයක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට යන විට, එම ඔඩපනය උගස් කර ඇත්තේ යම් බඩු උගස්ගන්නකු වෙත ද ඒ බඩු උගස්ගන්නා විසින් එම විකිණීම පැවැත්වීමට නියමිත දිනය හා වේලාව ද එම විකිණීම පැවැත්වීමට නියමිත ස්ථානය ද දිසාපති වෙත යටත් පිරිසෙයින් දින දහ හතරකට කලින් දැනුම් දිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ණය, පොලිය සහ ව්‍යාපාර පිරිවැටුම් බද්ද ඉක්මවන මුදලකට ඔඩපනය විකිණීමක දී කාර්ය පරිපාටිය.

28. මේ ආඥාපනත යටතේ ඔඩපනයක් විකුණනු ලැබූ සෑම අවස්ථාවක ම එම ඔඩපනය මත දෙන ලද ණය මුදල හා එම ඔඩපනය විකුණන දිනය දක්වා එම ණය මුදල වෙනුවෙන් අයවිය යුතු පොලිය ද ඒ ණය වෙනුවෙන් ගෙවිය යුතු ව්‍යාපාර පිරිවැටුම් බද්දක් වේ නම් එම බද්ද ද ඉක්මවන මුදලකට එම ඔඩපනය විකුණනු ලැබූ විට, බඩු උගස්ගන්නා විසින්—

(අ) ඔඩපනය විකුණනු ලැබූ මුදල ද අවශ්‍ය විකිණීමේ වියදම් සහ ගාස්තු අඩු කිරීමෙන් පසු උගස්කරුගේ බැරට ඉතිරිවී

ඇති මුදල ද එම ඔබපනය උගස් කළ තැනැත්තාට නොපමාව දැනුම් දිය යුතු ය; තව ද

(ආ) විකිණීමේ දින සිට එක් අවුරුද්දක් ඇතුළත ඉල්ලා සිටිනු ලැබුවහොත්, උගස්කරුගේ බැරට ඇති මුදල එම ඔබපනයට අදාළ උගස් තුණ්ඩුව දරන තැනැත්තාට ගෙවිය යුතු ය; තව ද

(ඇ) එකී එක් අවුරුදු කාලසීමාව තුළ එවැනි ඉල්ලීමක් කරනු නොලැබුවහොත්, ඒ කාලසීමාව ඉකුත් වූ වහාම, උගස්කරුගේ බැරට ඇති මුදල ළඟම ඇති කච්චේරියෙහි උගස්කරුගේ බැරට තැන්පත් කළ යුතු ය.".

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" 26, 27 සහ 28 වන වගන්ති යටතේ දැනුම්දීමේ පිළිවෙල.

30. 27 වන වගන්තිය හෝ 28 වන වගන්තිය යටතේ යවනු ලබන සෑම දැනුම්දීමක්ම, ඔබපන පොතෙහි ඇතුළත් කර තිබෙන ලිපිනයට, උගස්කරු වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතු ය. ලියාපදිංචි කිරීමේ ගාස්තුව උගස්කරු විසින් දැරිය යුතු ය. 26 (2) වන වගන්තිය යටතේ යවනු ලබන සෑම දැනුම්දීමක් ම ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතු ය.".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තියේ (ඔ) ඡේදයට (ඕ) ඡේදය වශයෙන් නැවත අක්ෂර යෙදීමෙන්; සහ

(ආ) එම වගන්තියේ (ඒ) ඡේදයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් (ඔ) ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(ඔ) තමා වෙත උගස් කර තිබෙන සියලු ම භාණ්ඩවල සම්පූර්ණ වටිනාකම දක්වා තම ව්‍යාපාරය රක්ෂණය කිරීමට අපොහොසත් වන්නා වූ; හෝ".

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" දඬුවම.

41. මේ ආඥාපනත යටතේ වරදක් කරන සෑම තැනැත්තකු ම රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ හය මසකට නොවැඩි කාලයක් දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කරනු ලැබීම යන දෙකට ම යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උප ලේඛනය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය මෙහි පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) එම උපලේඛනයේ දක්වා ඇති "අ" ආකෘතිය වෙනුවට පහත සඳහන් අලුත් ආකෘතිය ආදේශ කිරීමෙන් :—

"අ" ආකෘතිය

**බලපත්‍රය**

..................දිස්ත්‍රික්කයේ, දිසාපති .................... වන මම...................... පදිංචි ............ට.............. දිස්ත්‍රික්කයේ ........... සීමා ඇතුළත .........ස්ථානයෙහි, බඩු උගස්ගන්නකු වශයෙන් ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බඩු උගස්ගන්නන්ගේ ආඥාපනතේ විධිවිධාන යටතේ, මෙයින් බලය පවරා අවසර දෙමි.

මෙම බලපත්‍රය 19.........ජූලි මස 31 වන දිනයෙන් අවසන් වේ.

.......................

දිසාපති.'; සහ

(ආ) උපලේඛනයේ "උ" ආකෘතිය වෙනුවට පහත සඳහන් අලුත් ආකෘතිය ආදේශ කිරීමෙන් :—

"උ" ආකෘතිය

**ලදුපත**

.........................වන දින අංක.............දරන ඔඩපනය නිදහස් කිරීමෙන් ලැබුනා

| | | රු. | ශත |
|---|---|---|---|
| ණය මුදල | ... | ... | |
| ලාභය හෝ පොලිය | ... | ... | |
| ව්‍යාපාර පිරිවැටුම් බද්ද | ... | ... | |
| එකතුව | ... | | |

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන් වන උප ලේඛනය සංශෝධනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන් වන උපලේඛනය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) "බඩු උගස්ගන්නන් විසින් අය කළ හැකි පොලී ප්‍රමාණයන්" යන ශීර්ෂය අත්හැරීමෙන් ; සහ

(ආ) එම උපලේඛනයේ "අ" සහ "ආ" ඡේද වෙනුවට පහත සඳහන් ඡේද ආදේශ කිරීමෙන් :—

"අ. පොලී ප්‍රමාණය.

ණයට දෙනු ලබන සෑම රුපියලක් හෝ රුපියලකින් කොටසක් සඳහා පොලී ප්‍රමාණය සෑම මාසයක් හෝ මාසයකින් කොටසක් සඳහා ශත දෙකක් විය යුතු ය.

ආ. ව්‍යාපාර පිරිවැටුම් බද්ද.

ඔබපනයක් මත දෙනු ලබන ණයක් වෙනුවෙන් බඩු උගස්ගන්නා විසින් 1963 අංක 11 දරන මුදල් පනත යටතේ ව්‍යාපාර පිරිවැටුම් බද්දක් ගෙවිය යුතු වන අවස්ථාවක, එම බද්ද උගස්කරුගෙන් අය කර ගත හැකි ය.".

19. ප්‍රධාන ප්‍රඥප්තියේ හතර වන උපලේඛනයේ 4 වන නියෝගය වෙනුවට පහත සඳහන් අලුත් නියෝගය ආදේශ කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ හතර වන උපලේඛනය සංශෝධනය කිරීම.

"4. වෙන්දේසිකරු විසින්, යටත් පිරිසෙයින් එක් සිංහල පුවත් පතක, එක් දෙමළ පුවත් පතක, හා එක් ඉංග්‍රීසි පුවත් පතක පළ කරන දැන්වීමක් මගින් සහ විකිණීම පැවැත්වෙන ප්‍රදේශයේ මහජනයා ගැවසෙන ස්ථානයන්හි ප්‍රදර්ශනය කරන දැන්වීම් මගින්, විකිණීම පිළිබඳව දැනුම් දිය යුතු ය. එම දැන්වීම්වල

(අ) බඩු උගස්ගන්නාගේ නම හා ව්‍යාපාරික ස්ථානය; සහ

(ආ) ඔබපනයන් උගස් කරන ලද මාස

සඳහන් විය යුතු ය.".